ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேசிய சங்வர்த்தனை வங்கி
Pradeshiya Sanwardhana Bank

රැකියා අවස්ථා

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පහත දැක්වෙන තනතුර සඳහා සුදුසුකම්ලත් නිපුණතාපූර්ණ, කාර්ය ශූර, උද්යෝගිමත් අරමුණු වෙත හඹායන තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කළමනාකරණ අභ්‍යාසලාභී (Management Trainees)

යෝග්‍යතා නිර්ණායක

1. ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පහත සඳහන් ඕනෑම විෂයකින්/ක්ෂේත්‍රයකින් **පංති සාමාර්ථයක් සහිතව** උපාධියක් ලබා තිබීම.
   බැංකුකරණය සහ මූල්‍ය, කළමනාකරණය (රාජ්‍ය/ ව්‍යාපාර පරිපාලනය) ගණකාධිකරණය, වාණිජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කෘෂිකර්මය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, විද්‍යාව, ගණිතය, අලෙවිකරණය, නීතිය, සංඛ්‍යානය හෝ දේපළ තක්සේරුව.
   හෝ
   ඉහත සඳහන් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් සාමාන්‍ය සාමාර්ථයක් සහිත උපාධියක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් (IBSL) බැංකු හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාවක් (DBF- පැරණි විෂය නිර්දේශය) හෝ ව්‍යවහාරික බැංකු හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාවක් (DABF) හෝ බැංකු හා මූල්‍ය පිළිබඳව උසස් ඩිප්ලෝමාවක් (HDBF) හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි (ICA Sri Lanka) Corporate Level සම්පූර්ණ කර තිබීම.
   හෝ
   ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) ආශ්‍රිත සාමාජිකයෙකු වීම (Associate Membership) හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICA-Sri Lanka), එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ (CIMA-UK), එක්සත් රාජධානියේ වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA-UK), CFA ආයතනයෙහි මූල්‍ය විශ්ලේෂක වැඩසටහනේ (CFA-USA), ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA Sri Lanka), එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM-UK), එංගලන්තයේ සහ වේල්ස් හි වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICA-EW), අවසාන විභාගයෙන් සමත්වූවකු වීම.
3. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය සහ දෙවන භාෂාවකින් කටයුතු කිරීමේ හැකියාව ඇති අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
4. ප්‍රජා මූලික කටයුතු පිළිබඳව මනා අවබෝධයක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
5. වයස අවුරුදු 28 ට අඩු විය යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

තෝරා ගැනීමේ පටිපාටිය

- අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා, ස්ථානීය ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලබන අතර, ඉන් අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) විසින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.
- බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) අධීක්ෂණය යටතේ පවත්වනු ලබන, ස්ථානීය අධීක්ෂණය යටතේ පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගය මත පදනම්ව මෙම තෝරා ගැනීම සිදු කෙරේ.
- ලිඛිත විභාගයෙන් සමත්වන අපේක්ෂකයින් බැංකුව විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා කෙටි ලැයිස්තුගත (Shortlisted) කිරීමක් සිදු කරනු ලබන අතර, අවසාන තෝරාගැනීම සිදු කරනු ලබන්නේ එම සම්මුඛ පරීක්ෂණය මත පදනම්වය.
- පහත සඳහන් ප්‍රශ්න පත්‍ර සහ විෂයන්ගෙන් සමන්විත මෙම ස්ථානීය ලිඛිත තරඟ විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
- අපේක්ෂකයින්ට 01 සහ 02 ප්‍රශ්න පත්‍ර සඳහා තෝරා ගත හැක්කේ එක භාෂා මාධ්‍යයක් පමණක් වන අතර, මාධ්‍යයක් තෝරාගත් පසු, කිසිදු හේතුවක් මත එය වෙනස් කිරීමට අවසර නොලැබේ.

#	විෂය	මාධ්‍යය	කාලය	ලකුණු
01 වන ප්‍රශ්න පත්‍රය	විශ්ලේෂණ කුසලතා හා බුද්ධි පරීක්ෂණය (MCQ)	සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි	පැය 01	100
02 වන ප්‍රශ්න පත්‍රය	සාමාන්‍ය දැනීම (MCQ)	සිංහල/ දෙමළ/ ඉංග්‍රීස	පැය 01	100
03 වන ප්‍රශ්න පත්‍රය	ඉංග්‍රීසි භාෂාව	ඉංග්‍රීස	පැය 01	100
	මුළු එකතුව			**300**

- ස්ථානීය අධීක්ෂණය යටතේ පවත්වනු ලබන මෙම ලිඛිත තරඟ විභාගය **කොළඹ** පිහිටි විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට බැංකුව විසින් තීරණය කරනු ලබන අවම සුදුසුකම් හා නිර්ණායක අපේක්ෂකයෙකු සපුරා නොමැති නම් හෝ ව්‍යාජ / වැරදි තොරතුරු ඉදිරිපත් කර තිබුණහොත්, ඔහු/ඇය විභාගය සමත් වී තිබුණද බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අදියරයකදී වැඩිදුර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සම්මුඛ පරීක්ෂණ අදියරයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සිදුකරනු ලබන සහතික/ සුදුසුකම් සත්‍යාපන ක්‍රියාවලියේදී ඉහත අවශ්‍ය සුදුසුකම් සනාථ කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීමට කිසියම් අපේක්ෂකයෙකු අපොහොසත් වුවහොත්, ඔහු/ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තෝරාගනු ලබන අපේක්ෂකයින් බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලව රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමැත්තෙන් සිටිය යුතුය. සේවා ස්ථානගත කිරීම් බැංකු කළමනාකාරිත්වයේ අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.
- තරඟ විභාගයෙන් ලබා ගන්නා ලකුණු භාවිතා කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණ සඳහා අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත (Shortlisted) කිරීමට පමණි. අවසාන තෝරාගැනීම සිදු කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු මත පමණි.
- අවසාන තෝරාගැනීම සිදු කරනු ලබන්නේ හදුනාගත් පුරප්පාඩු මත පදනම්ව කුසලතා අනුපිළිවෙලට අනුවය.

පුහුණු කාලය සහ පත්වීම ලබාදීම

- පුහුණු කාලය වසර 02 වන අතර පළමු වසර සඳහා ස්ථාවර මාසික දීමනාවක් රු 90,000/- සහ දෙවන වසර සඳහා රු.100,000/- ක ගෙවනු ලැබේ.
- පුහුණු කාලය තුළ අර්ධ වාර්ෂික ඇගයීම් පවත්වනු ලැබේ. බැංකුවේ තෘප්තිමත්භාවයට අනුව පුහුණුවේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු, ස්ථිර සේවක මණ්ඩලයේ IV වන නිලධාරි ශ්‍රේණියට පත් කරනු ලබන අතර, මසකට රු. 81,115 - 930 × 3 - 83,905/- වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් අදියරෙහි පිහිටවනු ලැබේ. මීට අමතරව, බැංකුවෙන් ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද ලබා දෙනු ලැබේ. (මාසික දළ වැටුප රු. 180,000/- පමණ වනු ඇත)
- සේවය ස්ථිර කිරීම වසරක පරිවාස කාලයකට යටත්වේ (එය වසර දෙකක පුහුණු කාලයෙන් පසුව ගණනය කෙරේ) සහ පරිවාස කාලය තුළ කාර්යසාධනය ඇගයීමට ලක් කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය

2026 දෙසැම්බර් 20

අයදුම්පත් යොමු කිරීම

- අදාළ අයදුම්පත් සබැඳිය **www.rdb.lk** වෙබ් අඩවියේ **"Career"** ටැබය යටතේ ප්‍රකාශයට පත් කර ඇත. "Apply", බොත්තම තේරීමෙන් පසු, අපේක්ෂකයින් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) විසින් පහසුකම් සපයන **ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සඳහා කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2026/27** සඳහා වන මාර්ගගත අයදුම්පත වෙත යොමු කරනු ලැබේ.
  අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර මාර්ගගතව (Online) පමණි. මාර්ගගත අයදුම් කිරීමේ ක්‍රියාවලිය **2026 නොවැම්බර් මස 30 වැනි දින** විවෘත වන අතර **2026 දෙසැම්බර් මස 20 වැනි දින පැය 23.59** ට අවසන් වේ.
- අපේක්ෂක අයදුම්පත්‍රයේ පහත සඳහන් වලංගු හැඳුනුම්පත් අංකයකින් එකක් සඳහන් කළ යුතුය. එම සඳහන් කළ අංකයට අදාළ හැඳුනුම්පත, සත්‍යාපනය සඳහා විභාග මධ්‍යස්ථානයටද ඉදිරිපත් කළ යුතුය.
  I ජාතික හැඳුනුම්පත (National Identity Card) හෝ
  II වලංගු විදේශ ගමන් බලපත්‍රය (Valid Passport)
- මාර්ගගත විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සාර්ථකව ඉදිරිපත් කළ පසු, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) වෙත සපයා ඇති විද්‍යුත් තැපැල් ලිපිනය හරහා අයදුම්පත ලැබුණු බව අපේක්ෂකයින්ට දැනුම් දෙනු ඇත.
- **මෙම මාර්ගගත ක්‍රියා පටිපාටිය හැර වෙනත් කිසිදු ක්‍රමයක් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් මත පිළිගනු නොලැබේ.**
- අයදුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) **www.ibsl.lk** වෙබ් අඩවියේ දක්වා ඇත. එම උපදෙස් හොඳින් කියවා අයදුම්පත පිරවීම අයදුම්කරුගේ වගකීමකි.
- IBSL හි අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුකූල නොවන ඕනෑම අයදුම්පතක් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අදියරයේදීම ස්වයංක්‍රීයව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විභාග ගාස්තු ගෙවීම

ආපසු නොගෙවනු ලබන විභාග ගාස්තුව අයදුම්කරුවෙකුට **රු 3,000/-** ක් වන අතර, බැංකුව වෙත ගෙවිය යුතු මෙම ගාස්තුව අයදුම්පත් ක්‍රියාවලිය හරහා මාර්ගගතව අයකරනු ලැබේ.
මාර්ගගත ගෙවීම් පහසුකම් සක්‍රීය කරන ලද Visa/ Mastercard/ UnionPay හර (Debit) හෝ ක්‍රෙඩිට් කාඩ්පතක් පමණක් භාවිතා කර **රු 3,000/-** ක විභාග ගාස්තුවක් ගෙවීම් සිදු කළ යුතුය.

වෙනත් නියමයන් සහ කොන්දේසි

- විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් පනවන ලද නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ.
- සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලද මෙම දැන්වීමේ භාෂා අනුවාදයන් අතර යම් විෂමතාවයක් හෝ නොගැලපීමක් ඇති බව පෙනී ගියහොත් එවැනි අවස්ථාවක, සිංහල ප්‍රකාශනයට අනුකූලව පියවර ගනු ලැබේ.
- සියලුම අයදුම්පත් දැඩි රහස්‍යභාවයෙන් යුතුව සලකනු ලබන අතර, ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් (Canvassing) නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- කෙටි ලැයිස්තුගත (Shortlisted) කරන ලද අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අදියරයකදී, පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම් කල් දැමීම හෝ අවලංගු කිරීම මෙන්ම දැන්වීමේ ඇතුළත් කර නොමැති වෙනත් තොරතුරු මත පදනම්ව වැඩිදුර දැනුම් දීමකින් තොරව තීරණය කිරීමේ අයිතිය බැංකුව සතුය.
- පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) අපේක්ෂකයින්ගේ තොරතුරුවල පෞද්ගලිකභාවය සහ රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ .

ප්‍රධාන මානව සම්පත් නිලධාරි
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
අංක 933, නුවර පාර
වෙදමුල්ල , කැලණිය.

011 203 54 54
www.rdb.lk